**තිරුක්කෝවිල් ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3
ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

2013 ඔක්තෝබර් 02 දිනැති අංක 03/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2011 වන වසරේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් පළමු ප්‍රමිතීන් හතර අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වූවද, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.
(ආ) විදුලි ගාස්තු, ජල ගාස්තු හා දුරකථන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු එකතුව රු. 25,500 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.
(ඇ) සමාලෝචිත වර්ෂයෙදි ස්ථාවර තැන්පත් මත ලද පොළිය වන රු. 47,500 ක මුදල ගිණුම්වලින් අත්හැරි තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදි යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලද වාහනයේ වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

2011 වර්ෂයේදී ස්ථාන මාරුවී ගිය නිලධාරින් තුන් දෙනෙකුගෙන් සහ 2004 වර්ෂයේදී මියගිය නිලධාරියෙකුගෙන් අයවියයුතු රු. 115,337 ක සේවක ණය ශේෂය, අදාල ආයතනවලින් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2014 ජුනි 09 දින දක්වා කටයුතු කර නොතිබුණි.

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 වගන්තිය | ආදායම් රැස්කරන්නහට හෝ නිලධාරීන්ට දේපල බදු නොගෙවූ බවට ලේකම් විසින් අත්සන් කරන ලද වරෙන්තුවක් ලබාදී නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 1 පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය රාජකාරිමය වශයෙන් පවරන ලද නිලධාරින් දෙදෙනෙකුගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු. රෙ. 396(බී) | නිකුත්කර මාස හයක් ඉක්මවූ මාරු නොකරණ ලද එකතුව රු. 558,414 ක් වටිනා චෙක්පත් 22 ක් සම්බන්ධයෙන් අදාල රෙගුලාසි අනුව කටයුතුකර නොතිබුණි. |
| (ii) මු. රෙ. 571(2) | රු. 272,690 ක කල් ඉකුත්වූ තැන්පතු අදාල පාර්ශවයන්ට ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට 2014 ජුනි 09 දින දක්වා කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,532,256 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත්

වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,938,017 ක් වුයෙන් මූලා ප්‍රතිඵලයේ රු. 1,450,761 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2013 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු රු. 843,950 ක උසාවි දඩ මුදල නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබාගෙන නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 වර්ෂයේ අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් විසින් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම් සඳහා ස්ථාපිතකරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 09 ක් සඳහා සහ දුරකථන ආයතනයන් විසින් ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුනු 07 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවියයුතු රු. 125,000 පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) 1982 සිට 2012 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව හිගව පැවති අද දක්වා අය නොවී පවතින රු. 637,386 ක මස් කඩ බදු මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර හතරට වැඩි කාලයක් හිඟව පවතින කඩකුලිය වන රු. 718,995 ක මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකර ගත් එකතුකල අගය මත බදු මුදල වන රු. 66,644 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතට ප්‍රේෂණය කිරීමට විගණන දිනය වන 2014 ජූනි 09 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) තම්පිලුවිල් මහජන පුස්තකාලය විසින් සාමාජිකයන් වෙත ලබා දී තිබූ රු. 7,227 ක් වටිනා පොත් 37ක් ඔවුන්ගෙන් නැවත ලබා ගැනීම සඳහා වසර තුනක පමණ කාලයක් කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය වත්කම්
-------------------
පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල් තෙල් නිෂ්පාදන යන්ත්‍රය ප්‍රයෝජනයට නොගැනීම
-----------------------------------------------------------------
2008 වර්ෂයේදී රු. 95,000 ක මුදලට සභාව විසින් මිලදීගෙන තිබූ පොල් තෙල් නිෂ්පාදන යන්ත්‍රය අදාල අරමුණ සඳහා යොදවා ගැනීමෙන් තොරව 2014 ජුනි 09 දින දක්වා ගබඩාවේ රදවා තිබූ බව නිරික්ෂණය විය.

(ආ) කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීමේ යන්ත්‍රය ප්‍රයෝජයනට නොගැනීම
-------------------------------------------------------------------
සභාව විසින් 2008 වර්ෂයේ රු. 1,314,100 ක මුදලට මිලදීගෙන තිබූ කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීමේ යන්ත්‍රය අදාල අරමුණ සඳහා ප්‍රයෝජනයට නොගෙන 2014 ජුනි 09 දින දක්වා ගබඩාවේ රඳවා තිබූ බව නිරීක්ෂණයවිය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------
4.1 අභ්‍යන්තර විගණනය
------------------------
එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම